# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඩබ්ලිව්.එස්.පී. විජේවර්ධන,
38,
රත්නායක මාවත,
පැලවත්ත,
බත්තරමුල්ල

**අභියාචක**

**අභියාචනා අංකය :**
**RTIC/Appeal/624/2022**

එදිරිව

ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
නිල මැදුර,
අල්විටිගල මාවත,
කොළඹ 05

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** : 1.විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2.විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3.නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
4. ඒ.එම් නභියා - අධ්‍යක්ෂ ජනරාල්-පුනරුත්ථාපන (විශ්‍රාමික) - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී. අභියාචක වෙනුවෙන් නීතිඥ එස්. දයාරත්න මයා සහ නීතිඥ බී. ගුණරත්න මිය පෙනී සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් ජොෂ්ඨ සහකාර ලේකම් ඩී.ඩබ් සිරිවර්ධන මිය සහ සංවර්ධන නිලධාරි අයි දර්ශන මයා පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.06.02, 2022.08.17, 2022.10.19

**තීරණය කළ දිනය** : 2022.10.19

**<u>තීරණය :</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2021.11.10 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*" තොරතුරු ඉල්ලා මා විසින් ඉදිරිපත් කරන ලද 2021.09.21 දරණ ලිපියත් ඔබ විසින් පිළිතුරු ලබාදුන් 2021.10.21 දින දරණ ලිපියත් හා බැඳේ.*

*ඔබ විසින් මේ සම්බන්ධයෙන් ලබාදී ඇති තොරතුරු සම්බන්ධයෙන් මා පහත සඳහන් හේතු මත සෑහීමකට පත්නොවන බව කාරුණිකව දන්වමි.*

*1. මා සතු කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා නල ළිඳක් ඉදිකිරීම රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් කීපදෙනෙකු විසින් සිතාමතාම හා ද්වේශසහගතව අවුරුදු 1 1/2 ක් පමණ කාලයක් ප්‍රමාද කිරීමෙන් ඔවුන් මා හට ඇති විශාල මූල්‍ය අලාභයක් සිදු කොට ඇත. එම නිසා නල ළිඳ සඳහා අනුමැතිය ලැබුණු පමණින් මා සෑහීමකට පත් නොවන අතර මෙම අකටයුත්ත සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද, ඔවුන් හට ගත විනය ක්‍රියාමාර්ග මොනවාද හා එම විනය ක්‍රියාමාර්ග හරියාකාරව ක්‍රියාවට නැංවී ඇත්ද යන කරුණු දැනගැනීම මා සතු අයිතිවාසිකමක් සේ මා සලකමි.*

*2. මෙම විමර්ශනය සිදු කළේ මා විසින් කරන ලද ලිඛිත පැමිණිල්ලක් අනුව වන අතර මා චෝදනා ගොනු කළේ හිටපු ප්‍රාදේශීය ලේකම්, හිටපු සහකාර ප්‍රාදේශීය ලේකම්, ග්‍රාමසේවක හා ඉඩම් අංශයේ නිලධාරියෙකු සම්බන්ධයෙනි.*

*3. මා ඉල්ලා සිටින්නේ තුන්වන පාර්ශවයකට අයත් තොරතුරු නොවන අතර පැමිණිලිකාර පාර්ශවය වන මා කළ පැමිණිල්ලට අනුව සිදු කරන ලද විමර්ශනයෙහි තීරණ හා නිර්දේශයන් පමණි.*

*4. උදාහරණයක් ලෙස ඔබගේ 2021.10.21 දරණ ලිපියෙහි අංක III යටතේ සඳහන් කර ඇත්තේ අංක 02 හා 03 නිර්දේශ අනුව වගකිවයුතු නිලධාරීන් සම්බන්ධව විනයානුකූල පියවර ගෙන ඇති බවය. මෙහිදී අංක 02 හා 03 නිර්දේශ මොනවාද? වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද? ඔවුන් සඳහා ගත් විනයානුකූල පියවර මොනවාද? යන්න දැනගැනීම පමිනිකරු හා අගතියට පත් පාර්ශවය ලෙස මා හට අයිතිවාසිකමක් ඇති බව විශ්වාස කරමි..........*

*එමනිසා මා නැවත වරක් ඉල්ලා සිටින්නේ තොරතුරු දැනගැනීමේ පනත යටතේ මා විසින් 2021.09.21 දින දරණ ලිපිය මඟින් ඉල්ලා ඇති තොරතුරු පැහැදිලි ලෙස ලබාදෙන ලෙසටය."*

තොරතුරු නිලධාරියා විසින් 2021.12.23 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා ඇත්තේ,

*" .........රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීම අභ්‍යන්තර කරුණක් වන අතර, තෙවන පාර්ශවයේ කැමැත්ත ලබා දෙන තුරු අදාළ තොරතුරු පිටස්තර පාර්ශවයක් වෙත ලබාදීමට නොහැකි බව කාරුණිකව දන්වමි...."* යනුවෙනි.

එකී ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2022.01.10 දිනැතිව නම්කළ නිළධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරියා විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.03.14 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

කෙසේවුවද, අභියාචක විසින් 2021.11.10 දිනැතිව යොමුකරන ලද තොරතුරු ඉල්ලීමට හා 2022.01.10 දිනැතිව යොමු කරන ලද අභියාචනයට අදාළව තොරතුරු නිලධාරී විසින් 2022.01.25 දිනැතිව පිළිතුරු සපයමින් පවසා ඇත්තේ,

*" ...............ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු ලබා දීම සඳහා එහි තෙවන පාර්ශවය වන රිදීගම හිටපු ප්‍රාදේශීය ලේකම් එම්.පී.ඩබ්. ශිරෝමනී මහත්මියගෙන් හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සේවා නිලධාරී යූ.එම්.සී.කේ.ප්‍රියලාල් මහතාගෙන් ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු ලබා දීමපිළිබන්දව එකඟතාවය විමසන ලද අතර, එම නිලධාරීන් විසින් අදාළ තොරතුරු ලබා දීම පිළිබඳව අකමැත්ත ප්‍රකාශ කර ඇති බව කාරුණිකව දන්වමි." යනුවෙනි.*

**සළකා බැලීම**

ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමට අදාළ තොරතුරු සැපයීම පොදු අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර ඇතත්, එසේ ප්‍රතික්ෂේප කිරීම සඳහා පනතේ 5 (1) වගන්තියේ විධිවිධාන අදාළ කර ගත් බවක් ඉදිරිපත් වී ඇති ලේඛන වලින් නොපෙනේ. තොරතුරු නිලධාරි සඳහන් කර ඇත්තේ තෙවන පාර්ශවයේ කැමැත්ත ලබා ගෙන තොරතුරු මුදා හරින බවකි. නම් කළ නිලධාරි ද අභියාචනා පරීක්ෂණයේදී එම ස්ථාවරයම ගෙන ඇත. එසේ වුවත්, 5 (1) වගන්තියේ විධිවිධාන අදාළ කර ගත් බවක් නොපෙනේ.

අභියාචක ඉල්ලා ඇති තොරතුරු ඔහුගේ ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමේ දක්වා ඇති අතර එහි 5 වන අයිතම අංකය යටතේ ඉල්ලා ඇති තොරතුරු පනතේ 43 වන වගන්තියේ අර්ථනිරූපණය තුළට තොරතුර යන අර්ථනිරූපණය තුළට ඇතුළත් කළ නොහැක.

ඉහත තොරතුරු ඉල්ලීමේ අංක 01, 02, 03 සහ 04 යටතේ ඉල්ලා ඇති තොරතුරු සම්බන්ධයෙන් නම් කළ නිලධාරි විසින් එළඹ ඇති තීරණය හා එකඟ වීමට කිසිදු නීතිමය රාමුවක් ඔහු විසින් දක්වා නොමැත. එබැවින් නම් කළ නිලධාරිගේ උක්ත සඳහන් තීරණය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමින් ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමේ අංක 01, 02, 03 සහ 04 යටතේ ඉල්ලා ඇති තොරතුරු 2022.11.23 වන දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවට පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ

පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිළධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.
මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.